ඒකාබද්ධ සේවා චක්‍රලේඛ :05/2016

මගේ අංකය : PA/CS/POLICY/වා.ස්.මා.2017
රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.
2016.06.29 වෙනි දින.

අමාත්‍යාංශ ලේකම්වරුන්,
දිස්ත්‍රික් ලේකම්වරුන් / දිසාපතිවරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්.

## ඒකාබද්ධ සේවාවන්හි නිලධරයන්ගේ වාර්ෂික ස්ථාන මාරු - 2017

අංක 1589/30 හා 2009.02.20 දිනැති (අති විශේෂ) ගැසට් පත්‍රයේ පළකර ඇති රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති ( කාණ්ඩ අංක 1) හි XVIII පරිච්ඡේදයේ රාජ්‍ය නිලධරයන්ගේ ස්ථාන මාරුවීම් සම්බන්ධව විධිවිධානවලට ද මෙයට යා කර ඇති ඒකාබද්ධ සේවයේ ස්ථාන මාරු ප්‍රතිපත්තියටද ඔබේ අවධානය යොමු කරවනු ලැබේ.

02. ඒකාබද්ධ සේවයට අයත් පහත සඳහන් සේවාවන්හි වාර්ෂික ස්ථාන මාරු **2017** ජනවාරි මස **01** දින සිට බල පැවැත්වෙන සේ ක්‍රියාත්මක විය යුතුය.

i. රජයේ භාෂා පරිවර්තක සේවය (I පන්තිය)
ii. ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවය ( 2, 3 පන්ති )
iii. ශ්‍රී ලංකා රජයේ පුස්තකාලයාධිපති සේවය (III ,II ,I පන්ති)
iv. රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය (III, II, I ශ්‍රේණි)
v. ඒකාබද්ධ රියදුරු සේවය (III, II, I, විශේෂ ශ්‍රේණි)
vi. කාර්යාල සේවක සේවය (III, II, I, විශේෂ ශ්‍රේණි)

නිලධරයන්ට මෙන්ම රාජ්‍ය සේවාවටද ඇතිවන අපහසුතා මග හැරවීම පිණිස පහත සඳහන් ආකාරයට ස්ථාන මාරු පිළිබඳ ක්‍රියාමාර්ග අනුගමනය කිරීමට සැළකිලිමත් විය යුතුය. තව ද 2016 ජූලි මස 01 දිනයත්, 2016 දෙසැම්බර් මස 31 වන දිනයත් අතර කාලයේදී අන්‍යොන්‍ය ස්ථාන මාරුවීම් සඳහා ඉල්ලුම්පත්‍ර භාර නොගත යුතුය.

03. <u>**ස්ථාන මාරු කමිටු;**</u>
ස්ථාන මාරු කමිටු පහත සඳහන් ආකාරයට පිහිටුවීමට ක්‍රියා කළ යුතුය.

3.1 **දෙපාර්තමේන්තු ස්ථාන මාරු කමිටු - ස්ථාන මාරු තීරණ 2016.07.31 ට පෙර ලැබීමට සැලැස්විය යුතුය.**
දෙපාර්තමේන්තු ඇතුළත සේවා ස්ථානවලට කෙරෙන මාරුවීම් සම්බන්ධයෙන් කටයුතු කිරීම.
උදා: (දිස්ත්‍රික්කය තුළ ප්‍රාදේශීය ලේකම් කාර්යාල අතර කෙරෙන ස්ථාන මාරුවීම් සම්බන්ධයෙන් දිස්ත්‍රික් ලේකම් විසින් කටයුතු කිරීම.)

3.2 **අමාත්‍යාංශ ස්ථාන මාරු කමිටු - ස්ථාන මාරු තීරණ 2016.07.31 දිනට පෙර ලැබීමට සැලැස්විය යුතුය.**
එක් අමාත්‍යාංශයක් යටතේ වන දෙපාර්තමේන්තු අතර ස්ථාන මාරුවීම් සම්බන්ධයෙන් කටයුතු කිරීම.

3.3 **ඒකාබද්ධ සේවා අංශයේ ස්ථාන මාරු කමිටු**
අමාත්‍යාංශ අතර හා දෙපාර්තමේන්තුවල නිලධරයන්ගේ ස්ථාන මාරු සම්බන්ධයෙන් කටයුතු කිරීම.

3.3.1 ස්ථාන මාරු සඳහා ලැබෙන අයදුම්පත්‍ර සංඛ්‍යාව සැලකිල්ලට ගෙන ඒ ඒ සේවාවන් සඳහා ප්‍රමාණවත් අයදුම්පත්‍ර සංඛ්‍යාවක් ලැබී තිබේ නම් අදාළ සේවාවන් සඳහා වෙන වෙනම මාරු කමිටු පිහිටුවිය යුතුය.

3.3.2 සෑම ස්ථාන මාරු කමිටුවක් විසින්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීතීන්හි (කාණ්ඩ අංක 1) XVIII පරිච්ඡේදයට යටත්ව මෙම චක්‍රලේඛයේ 4 වගන්තියේ සඳහන් පොදු ප්‍රතිපත්තිවලට අනුකූලව ස්ථාන මාරු සිදු කළ යුතුය

**3.4 අභ්‍යන්තර ස්ථාන මාරු කමිටු තීරණ**

(අ) ඉහත 3:1 ඡේදයට අදාළව දෙපාර්තමේන්තු ස්ථාන මාරු කමිටු හා 3:2 ඡේදය යටතේ අමාත්‍යාංශ ස්ථාන මාරු කමිටු තීරණයන්ට එළඹීමෙන් අනතුරුව ඒකාබද්ධ සේවා අංශයේ මාරු කමිටුවලට තීරණ ගැනීමට හැකිවන පරිදි ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත එවීමට කටයුතු කළ යුතුය.

(ආ) ඒකාබද්ධ සේවයේ ස්ථාන මාරුවීම් ලැයිස්තු පිළියෙල කරන අවස්ථාවේදී හා සම්පූර්ණ කළ පසුව ද සමහර අමාත්‍යාංශ / දෙපාර්තමේන්තු ස්ථාන මාරුවීම් සිදුකරන හෙයින් වාර්ෂික ස්ථාන මාරුවීම් කිරීමේදී ව්‍යාකූලතා ඇතිවේ. එබැවින් මෙම තත්ත්වය මග හැරවීම සඳහා දෙපාර්තමේන්තු / අමාත්‍යාංශ ස්ථාන මාරුවීම් 7:1 ඡේදය යටතේ දක්වා ඇති කාල වකවානුවලට අනුකූලව පවත්වා ඒවායේ තීරණ 2016 ජූලි 31ට පෙර ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත දන්වා එවිය යුතුය. ඉන්පසු දෙපාර්තමේන්තු ස්ථාන මාරු කමිටු විසින් කිසිදු ස්ථාන මාරු තීරණයක් නොගත යුතුය.

(ඇ) අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තුවල අභ්‍යන්තර මාරු කමිටු තීරණ නියමිත දිනට පෙර ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් නොකළහොත් එම ස්ථාන මාරුවීම් නොකළා සේ සලකා ක්‍රියා කරනු ලැබේ.

04. <u>ස්ථාන මාරු සඳහා නිලධරයන්ගේ සුදුසුකම් තීරණය කිරීමේ පොදු ප්‍රතිපත්ති;</u>

මේ සම්බන්ධයෙන් ඒකාබද්ධ සේවයේ වාර්ෂික ස්ථාන මාරු ප්‍රතිපත්තියේ දෙවන වගන්තියේ විධිවිධාන අදාළ වේ.

05. <u>ඒකාබද්ධ සේවා අංශයේ ස්ථාන මාරු කමිටු වෙත ඉදිරිපත් කළයුතු ලේඛන;</u>

5.1 ඒකාබද්ධ සේවා අංශයේ පිහිටුවා ඇති ස්ථාන මාරු කමිටු වෙත පහත සඳහන් ලියකියවිලි 2016 ජූලි මස 31 දිනට පෙර ඉදිරිපත් කිරීමට අමාත්‍යාංශ ලේකම්වරුන් / දෙපාර්තමේන්තු ප්‍රධානීන් / දිස්ත්‍රික් ලේකම්වරුන් / ආයතන ප්‍රධානීන් ක්‍රියා කළ යුතුය.

5.2 (අ) මේ සමග ඒ.සේ./වා.ස්.මා./01 ආකෘතියට අනුව සකස් කරන ලද අන්තර් දෙපාර්තමේන්තු ස්ථාන මාරුවීම් අයදුම්පත් හා

(ආ) සියලුම ස්ථාන මාරු අයදුම්පත් උපලේඛණගත කරන ලද මේ සමග ඇති ඒ.සේ./වා.ස්.මා./02 දරන ආකෘතිය,

(ඇ) 2016.12.31 දිනට එකම ආයතනයක / දිස්ත්‍රික්කයක වසර 05ට වඩා සේවය කළ නිලධරයන්ගේ නාම ලේඛණයක් ඔවුන්ගේ වයස, සේවා කාලය, පදිංචි ප්‍රදේශය, ස්ථාන මාරු කළහොත් මාරු වී යාමට වඩාත් කැමති ස්ථාන 03 යනාදී සියලු තොරතුරු ඒ.සේ/වා.ස්.මා/03 ආකෘතියෙන් නිවැරදිව සම්පූර්ණ කර ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත, 2016.07.31 දිනට පෙර අදාළ අමාත්‍යාංශ ලේකම්වරුන්/ දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් එවිය යුතුය. <u>එමෙන්ම ඒ.සේ/වා.ස්.මා/03 ආකෘතියෙහි අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු/ කාර්යාලයන්හි රඳවා ගැනීමට අවශ්‍ය නිලධාරීන් සහ වෛද්‍ය සහතික මගින් සනාථ කර ඇති බරපතල රෝගාබාධ වලින් පෙලෙන ස්ථාන මාරු නොකළයුතු නිලධාරීන් සම්බන්ධයෙන් දෙපාර්තමේන්තු ප්‍රධානියා පුද්ගලිකවම සනාථ කළ යුතුය.</u>

(ඈ) ඉහත අංක 5.1 ඡේදය යටතේ කරන ලද අමාත්‍යාංශ /දෙපාර්තමේන්තු ස්ථාන මාරු නියෝග පිළිබඳ වාර්තාව ද මේ සමග එවිය යුතුය.

5.3 <u>ස්ථාන මාරු අයදුම්පත්‍ර;</u>

වාර්ෂික ස්ථාන මාරුවීම් සඳහා එවනු ලබන අයදුම්පත්‍රය මෙයට අමුණා ඇති ඒ.සේ./වා.ස්.මා./01 දරන ආකෘති පත්‍රය අනුව සකස් කර දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශ සහිතව ඉදිරිපත් කළ යුතුය. තව ද එක් නිලධරයෙකුට එක් අයදුම්පත්‍රයක් පමණක් ඉදිරිපත් කරන ලෙසට උපදෙස් දිය යුතුය. (දෙපාර්තමේන්තු හා අමාත්‍යාංශ මාරු කමිටු විසින් ද සුදුසු සංශෝධන සහිතව මෙම ආකෘති පත්‍රය පාවිච්චි කිරීම මැනවි) අයදුම්පත් ඉදිරිපත් කිරීමේදී ඒ සඳහා සකස් කර හඳුන්වා දෙනු ලබන ආදර්ශ ආකෘති පත්‍රයට අනුවම සකස් කළ අයදුම්පත් පමණක් ඉදිරිපත් කළ යුතු වේ.

**ස්ථාන මාරුවීම් අයදුම් කරන නිලධරයන් කිසියම් ප්‍රදේශයක නිශ්චිත කාර්යාලයකට පමණක්ම ස්ථාන මාරු වී යාමට අපේක්ෂා කරන්නේ නම් ප්‍රදේශයේ නම සහ කාර්යාලයේ නම යන දෙකම සඳහන් කිරීම සුදුසුය. තමන් ස්ථාන මාරු වී යාමට අපේක්ෂා කරන්නේ කිසියම් ප්‍රදේශයකට යාමේ අවශ්‍යතාවය මතද නැතහොත් තමන් කැමති දෙපාර්තමේන්තු හෝ කාර්යාලයකට යාමට වුවමනාවෙන් ද යන්න අයදුම්පතේ සඳහන් කිරීම සුදුසුය. ඒ අනුව තමන්ගේ මනාපය අනුපිළිවෙලින් දැක්වෙන පරිදි ප්‍රදේශ හෝ කාර්යාල නම් කළ යුතු වේ.**

**06.** <u>වාර්ෂික ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටු;</u>

6.1 ස්ථාන මාරු යෝජනාවන්ට විරුද්ධව කෙරෙන අභියාචනා සලකා බැලීම සඳහා කාර්ය පටිපාටිකරීතින්හි 210 වගන්තිය අනුව වාර්ෂික ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටු පිහිටුවා ඒ අනුව අවශ්‍ය කටයුතු කළ යුතුය. වාර්ෂික ස්ථාන මාරු සම්බන්ධයෙන් ඉදිරිපත් කරනු ලබන අභියාචනා සලකා බලනු ලබන්නේ කාර්ය පටිපාටික රීතීන්හි 211 වගන්තියට අනුකූල වේ නම් පමණි.

6.2 නිලධරයෙකුගේ ඉල්ලීමක් අනුව කරන ලද මාරුවීමක් අවලංගු කරන ලෙස හෝ කල් දමන ලෙසට පසුව අභියාචනා කිරීමට එම නිලධරයාට හෝ ඒ පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කිරීමට දෙපාර්තමේන්තු ප්‍රධානියාට හෝ හිමිකමක් නැත.

ස්ථාන මාරු නියෝගයන්ට විරුද්ධව කෙරෙන අභියාචනා සලකා බැලීම සඳහා වාර්ෂික ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටු විසින් පහත සඳහන් කරුණු පිළිබඳ තවදුරටත් පරීක්ෂා කර තීරණ ගනු ඇත.

- මාරුවීම් ප්‍රතිපත්තියට අනුකූල නොවන පරිදි කරන ලද මාරුවීම්
- නිලධරයන්ගේ ඉල්ලීම් ඉටු නොවුනු අවස්ථා (මනාප අනුව 1,2,3 යන සේවා ස්ථාන ඉල්ලීම් ලෙස සලකනු ලැබේ)
- නිලධරයන්ගේ ඉල්ලීම්වලට පටහැනි ලෙස කරන ලද මාරුවීම්
- ස්ථාන මාරුවීම් අයදුම් කරන ලද දිනයෙන් පසුව නිලධරයන්ට සිදුවූ හදිසි විපත්, කරදර, අසනීප වැනි සානුකම්පිත තත්ත්වයන් පිළිබඳව පිළිගත හැකි නිර්දේශිත ඉදිරිපත් කිරීම්

6.3 වාර්ෂික ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටු තීරණ නිකුත් කළ පසු ඉදිරිපත් කරනු ලබන අභියාචනා කාර්ය පටිපාටික රීතින්හි XX වන පරිච්ඡේදයේ 230 වගන්තිය අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතුය. සමාලෝචන කමිටුවට ඉදිරිපත් නොවූ අභියාචනා පිළිබඳ රාජ්‍ය සේවා කොමිෂන් සභාව සළකා නොබලනු ඇත.

07. <u>ස්ථාන මාරු කාල සටහන;</u>

7.1 මෙම චක්‍රලේඛයේ 3:1 හා 3:2 යටතේ ස්ථාන මාරු පිළිබඳව කටයුතු කිරීම සඳහා කාල සටහන

| | |
|---|---|
| ජුනි 15 ට පෙර | මාරු කමිටු පිහිටුවීම හා ස්ථාන මාරු පටිපාටිය සකස් කිරීම |
| ජූලි 01ට පෙර | ඉහත 3.1, 3.2 ඡේදය අනුව සියලුම ස්ථාන මාරු අයදුම්පත් භාරගන්නා අවසාන දිනය |
| ජූලි 15ට පෙර | 3.1, 3.2 ඡේදය අනුව දෙපාර්තමේන්තු /අමාත්‍යාංශ අභ්‍යන්තර ස්ථාන මාරු පිළිබඳ තීරණ ගෙන අවසන් කිරීම |
| ජූලි 31ට පෙර | 3.1, 3.2 ඡේද අනුව දෙපාර්තමේන්තු / අමාත්‍යාංශ ස්ථාන මාරු තීරණ සහිත ලේඛන සකස් කිරීම හා ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත එවීම |

සටහන : මෙම කාල සටහනට පසු කරන අභ්‍යන්තර ස්ථාන මාරුවීම් වලංගු නොවේ.

7.2 ඉහත 3.3 යටතේ ඒකාබද්ධ සේවා අංශයේ මාරු කමිටු කාල සටහන:-

| | |
|---|---|
| ජුනි 01ට පෙර | මාරු කමිටු පිහිටුවීම |
| ජුනි 15ට පෙර | ස්ථාන මාරු පටිපාටිය සකස් කර ගැනීම. |
| ජුනි 30ට පෙර | වාර්ෂික ස්ථාන මාරු චක්‍රලේඛය නිකුත් කිරීම. |
| ජූලි 31ට පෙර | ඒ.සේ./වා.ස්.මා./01 ආකෘතියට අනුව සම්පූර්ණ කරන ලද, ඒ.සේ./වා.ස්.මා./02 ආකෘතිය අනුව උපලේඛනගත කළ අයදුම්පත් හා ඒ.සේ./වා.ස්.මා./03 ආකෘතිය සම්පූර්ණ කර ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත එවීම. |
| අගෝස්තු 31ට පෙර | ඒකාබද්ධ සේවා අංශයේ මාරු කමිටු රැස් වී ස්ථාන මාරු තීරණ ගැනීම අවසන් කිරීම. |
| සැප්තැම්බර් 15ට පෙර | ස්ථානමාරු තීරණ අමාත්‍යාංශ/දෙපාර්තමේන්තුවලට දැන්වීම සහ වාර්ෂික ස්ථානමාරු යෝජනා සමාලෝචන කමිටු පත් කිරීම. |
| සැප්තැම්බර් 29ට පෙර | ස්ථානමාරුවීම් පිළිබඳව ඒකාබද්ධ සේවා අංශය වෙත සමාලෝචන කමිටු සඳහා අභියාචනා භාර ගැනීමේ අවසාන දිනය. |
| ඔක්තෝබර් 15ට පෙර | එම අභියාචනා පිළිබඳ සමාලෝචන කමිටු මඟින් තීරණ ගැනීම. |
| නොවැම්බර් 01ට පෙර | සමාලෝචන කමිටු තීරණ දැනුම් දීම අවසන් කිරීම. |

08. <u>වාර්ෂික ස්ථාන මාරු සම්බන්ධයෙන් දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ වගකීම;</u>

**8.1 ස්ථාන මාරුවීම් ලැබීමට ඉඩ ඇතැයි සිතන කිසියම් නිලධරයෙකු සේවා අවශ්‍යතාවය මත තවත් වර්ෂයක් තම දෙපාර්තමේන්තුව තුළ රඳවා ගතයුතුයයි දෙපාර්තමේන්තු ප්‍රධානියා අදහස් කරන්නේ නම්, නිර්දේශිත අයදුම්පත්‍ර යොමු කරන අවස්ථාවේදීම ඒ පිළිබඳව පැහැදිලි කර අදාළ අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශ ඇතිව ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත තම ඉල්ලීම් ඉදිරිපත් කළයුතු වේ. අධ්‍යක්ෂ ජනරාල් විසින් මාරු කමිටුවලට ඒ පිළිබඳව දැනුම් දී ක්‍රියා කරනු ඇත. එක් දෙපාර්තමේන්තු ප්‍රධානියෙකුට සීමිත නිලධරයන් පිරිසක් සඳහා පමණක් ඉල්ලීම් කළ හැක. එක් වතාවක දී මෙම අවස්ථාව ලබා දී ඇති නිලධරයෙකු සඳහා නැවත අවස්ථාවක් ලබා දෙනු නොලැබේ.**

8.2 සෑම නිලධරයෙක් පිළිබඳවම නිවැරදි හා සම්පූර්ණ තොරතුරු සැපයීමට ආයතන / දෙපාර්තමේන්තු ප්‍රධානීන් වගබලා ගත යුතුය. සාවද්‍ය අසම්පූර්ණ තොරතුරු සපයා ඇති බව හෙළිවුවහොත් ඒ පිළිබඳව අදාළ ආයතන / දෙපාර්තමේන්තු ප්‍රධානීන් හා එම ලැයිස්තු සකස් කළ හා හරි වැරදි බලන ලද නිලධරයන් වගකීමට බැඳී සිටින අතර සාවද්‍ය කරුණු ඉදිරිපත් කිරීම සම්බන්ධව විනය ක්‍රියාමාර්ග ගනු ලැබේ.

8.3. වාර්ෂික ස්ථාන මාරු නියෝග මගින් අමාත්‍යාංශයෙන් / දෙපාර්තමේන්තුවෙන් පිටතට ස්ථානමාරුවීම් ලබා දී ඇති නිලධරයන් අනුප්‍රාප්තිකයන් පැමිණෙන තෙක් රඳවා නොගෙන නියමිත දින නව සේවා ස්ථානයේ රාජකාරි භාරගැනීමට හැකි වන සේ ඔවුන් මුදාහැරීමට කටයුතු කළ යුතු ය. මෙම විධිවිධානවලට පටහැනිව කටයුතු කරන ආයතන ප්‍රධානීන් සම්බන්ධයෙන් විනයානුකූලව කටයුතු කිරීම පිණිස අදාළ බලධරයා වෙත වාර්තා කරනු ලැබේ.

8.4 ස්ථාන මාරුවීම් ලැබූ නිලධරයන් නියමිත දින සිට නව සේවා ස්ථානයේ රාජකාරී කටයුතුවලට වාර්තා කර තිබියදීත් ඇතැම් දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් අදාළ නිලධරයන් මුදාහැර නොමැති අවස්ථා වාර්තා වී ඇත. එවැනි අවස්ථා උද්ගත නොවීමට ආයතන ප්‍රධානීන් වගබලා ගතයුතු අතර එම නිලධාරීන් <u>මුදා නොහරින්නේ නම් තවදුරටත් වැටුප් ගෙවීම සම්බන්ධයෙන් ආයතන ප්‍රධානීන් විසින් වගකීම භාරගත යුතුය.</u>

8.5 ස්ථාන මාරු නියෝග ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් කාර්ය පටිපාටික රීති (කාණ්ඩ අංක 01) හි **11** වගන්තියේ විධිවිධාන වලට ද නිලධරයන්ගේ අවධානය යොමු කර විය යුතු වේ.

8.6 ස්ථාන මාරුවීම් ලැබේ යයි අපේක්ෂා කරන නිලධරයන්ගේ රාජකාරී කටයුතු කල් ඇතිව වෙනත් නිලධරයන් පුහුණු කර වාර්ෂික ස්ථානමාරුවීම් නියමිත දිනට ක්‍රියාත්මක කරවීමට දෙපාර්තමේන්තු ප්‍රධානීන්/ අමාත්‍යාංශ ලේකම්වරුන් විසින් කටයුතු කළ යුතු ය. මෙවැනි කරුණු සම්බන්ධයෙන් පසුව කෙරෙන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.

8.7 මෙම චක්‍රලේඛයේ සඳහන් විධිවිධාන ඔබගේ අමාත්‍යාංශයේ / දෙපාර්තමේන්තුවේ සියළුම නිලධරයන් වෙත දැන ගැනීමට සැලැස්විය යුතුය.

8.8 වාර්ෂික ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්යය පටිපාටික රීතීන්හි 214, 215, 216, 217 වගන්තිවල සඳහන් විධිවිධාන බලපැවැත්වෙනු ඇත.

09. <u>**නිලධරයන්ගේ වගකීම්;**</u>

වාර්ෂික ස්ථාන මාරු නියෝගයක් ලැබූ සියලුම නිලධරයෝ නියමිත දිනයේ දී නව රාජකාරී ස්ථානය වෙත සේවය සඳහා වාර්තා කිරීමට බැඳී සිටිති.

10. මෙම චක්‍රලේඛයේ දක්වා නොමැති විධිවිධාන සම්බන්ධයෙන් ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ තීරණය අවසාන තීරණය වේ.

11. මෙම චක්‍රලේඛය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති (කාණ්ඩ අංක 1)හි XVIII පරිච්ඡේදයේ 202 වගන්තිය අනුව නිකුත් කරනු ලැබේ.

**කේ.වී.පී.එම්.ජේ.ගමගේ**
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්
රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය.

## ඒකාබද්ධ සේවයේ නිලධරයන් සඳහා වන වාර්ෂික ස්ථාන මාරු ප්‍රතිපත්තිය

## 1. හැඳින්වීම

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2009.02.20 දිනැති අංක 1589/30 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද කාර්ය පටිපාටික රීති 1 වැනි කාණ්ඩයේ XVIII වැනි පරිච්ඡේදයේ 202 වගන්තියේ විධිවිධාන අනුව ඒකාබද්ධ සේවයේ නිලධරයන් සඳහා වන වාර්ෂික ස්ථාන මාරු පරිපාටිය සකස් කරනු ලැබේ.

## 2. වාර්ෂික ස්ථාන මාරු සඳහා යටත් වන නිලධරයන් පිළිබඳ විස්තර

### 2:1 අදාළ නිලධරයන්

ඒකාබද්ධ සේවයට අයත් පහත සඳහන් සේවාවන්හි නිලධරයන් සඳහා මෙම වාර්ෂික ස්ථාන මාරු ප්‍රතිපත්තිය අදාළ වේ.

i. රජයේ භාෂා පරිවර්තක සේවය (I පන්තිය)
ii. ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවය ( 2 / 3 පන්ති )
iii. සංවර්ධන නිලධාරී සේවය
iv. ශ්‍රී ලංකා රජයේ පුස්තකාලයාධිපති සේවය (III / II / I පන්ති)
v. රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය (III / II / I ශ්‍රේණි)
vi. ඒකාබද්ධ රියදුරු සේවය (III, II, I, විශේෂ ශ්‍රේණි)
vii. කාර්යාල සේවක සේවය (III / II / I/ විශේෂ ශ්‍රේණි)

### 2:2 සේවා ස්ථානයක සම්පූර්ණ කළ යුතු සේවා කාලය

2:2:1 තම සේවා ස්ථානයේ අඛණ්ඩව වසර 02ක් සේවය කරන ලද නිලධරයන් වාර්ෂික ස්ථාන මාරු වීම් සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ලබයි.

2:2:2 එකම සේවා ස්ථානයක වසර 05කට වැඩි සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධරයන් ස්ථාන මාරු වීම් වලට යටත් වේ.

2:2:3 ප්‍රියමනාප සේවා ස්ථාන වල වසර 05ක සේවා කාලයක් සම්පූර්ණ කරන ලද නිලධරයන් අනිවාර්යයෙන්ම ස්ථාන මාරු වීම් වලට යටත් වේ.

### 2:3 සේවා ස්ථාන වර්ගීකරණය -

2:3:1 රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති ( කාණ්ඩ අංක 1 ) හි XVIII පරිච්ඡේදයේ 203 වගන්තියෙහි (iii) හා (v) උප වගන්තිය අනුව ඒකාබද්ධ සේවයේ නිලධරයන් සඳහා පහත සඳහන් සේවා ස්ථාන ප්‍රියමනාප සේවා ස්ථාන ලෙස හැඳින්වේ. මෙම සේවා ස්ථාන ඉහත නිර්ණායකයන් අනුව වාර්ෂිකව වෙනස් විය හැක.

i. විදේශ කටයුතු අමාත්‍යාංශය
ii. රේගු දෙපාර්තමේන්තුව
iii. සුරාබදු දෙපාර්තමේන්තුව
iv. දේශීය ආදායම් දෙපාර්තමේන්තුව
v. ආගමන හා විගමන දෙපාර්තමේන්තුව
vi. මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව
vii. විශේෂ කාර්ය බලකා මූලස්ථානය
viii. විභාග දෙපාර්තමේන්තුව

සටහන :-

(අ) විදේශ කටයුතු අමාත්‍යාංශය රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයටද විභාග දෙපාර්තමේන්තුව රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයට හා කාර්යාල සේවක සේවයට ද මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව හා විශේෂ කාර්ය බලකා මූලස්ථානය රියදුරු සේවයටද ප්‍රියමනාප සේවා ස්ථාන ලෙස සළකනු නොලැබේ.

(ඇ) දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ස්ථාන මාරු කරනු ලබන නිලධාරීන් එම දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර ස්ථාන මාරු කිරීම්වලට යටත් වේ.

2:3:2 ස්ථාන මාරුවී යාමට ඉල්ලීම් අඩු ප්‍රමාණයක් ඇති සේවා ස්ථාන ප්‍රියමනාප නොවන සේවා ස්ථාන වශයෙන් හැඳින්වේ.

### 2:4 ක්‍රමවේදය සහ අනෙකුත් කරුණු

i. වාර්ෂික ස්ථාන මාරු පටිපාටියෙහි 2:2:1 ඡේදය යටතට ගැනෙන නිලධරයෙකු වෙනත් ස්ථානයකට මාරුවීමට ඉල්ලා ඇති විටක, එම ඉල්ලීම ඉටු කිරීම සඳහා එහි 2:2:2 ඡේදයේ අවශ්‍යතා සපුරා ඇති එම ස්ථානයේ වැඩිම සේවා කාලයක් සහිත නිලධරයන් ඉන් පිටතට මාරු කළ හැකිය.

ii. යම් සේවා ස්ථානයකට ස්ථාන මාරු වීමට වැඩි ඉල්ලීම් ප්‍රමාණයක් ඇතිවිට ඒ අතරින් වැඩිම සේවා කාලයක් සපුරා ඇති නිලධරයන් (අනෙකුත් කොන්දේසි වලට යටත්ව) එම සේවා ස්ථානයට ස්ථාන මාරු කරනු ලැබේ.

iii. ප්‍රියමනාප නොවන සේවා ස්ථානයක සේවය කළ නිලධරයකු යම් සේවා ස්ථානයකට මාරුවීමක් ඉල්ලා ඇති විට එම ඉල්ලීම ඉටු කිරීමට එකී ස්ථානයේ වැඩිම සේවා කාලයක් සහිත නිලධරයා ඉන් පිටතට මාරු කළ හැකිය.

iv. ප්‍රියමනාප ප්‍රදේශවලට ස්ථාන මාරුවීම් ලබා දීමේදී වඩාත් ප්‍රමුඛතාවය දක්වන්නේ ප්‍රියමනාප නොවන ස්ථානවල සේවය කළ නිලධාරීන්ටය. මෙවැනි ස්ථාන මාරු වලදී සේවා කාලය හා නිලධරයන් ඉදිරිපත් කර ඇති ප්‍රායෝගික ගැටළු තත්වයන්ද සළකා බලනු ලැබේ.

v. ස්ථාන මාරු කමිටු විසින් නිලධරයන් මාරු කිරීමේ දී දෙපාර්තමේන්තුවල සේවා අවශ්‍යතාවයන් ද කාර්යාලවල කාර්යමණ්ඩල කණිෂ්ඨ/ ජ්‍යෙෂ්ඨතාවයේ සමබරතාවය රැකීමට ද හැම විටම උත්සාහ කළ යුතු වේ. (උදා:-විභාග දෙපාර්තමේන්තුවට පිරිමි නිලධරයන් වැඩි ප්‍රමාණයක් රඳවා තැබීම).

**2:4:1** <u>සේවා කාලය ගණනය කිරීම.</u>

i. වාර්ෂික ස්ථාන මාරුවීම්වලදී කාල ගණනය කරනු ලබනුයේ වර්ෂයේ දෙසැම්බර් මස 31 වන දිනටය. (උදා :-2017 වාර්ෂික ස්ථාන මාරුවීම් සඳහා 2016.12.31 දිනය) ප්‍රියමනාප සේවා ස්ථාන සඳහා 2017.05.31 දක්වා කාලය ගණනය කරනු ලැබේ.

ii. සේවා කාලයන් ගණනය කිරීමේ දී සේවයේ ආරම්භක දිනය ලෙස සැලකිය යුත්තේ සේවයට වාර්තා කළ වර්ෂයේ ජනවාරි මස පළමු වන දිනයයි. නමුත් නිලධරයාගේ පාලන විෂයය ඉක්මවා ගිය කරුණක් හේතුවෙන් සේවයට වාර්තා කළ දිනය පසු දිනයක් වේ නම් ස්ථාන මාරු කමිටුව ඒ පිළිබඳව සැලකිල්ල යොමු කරයි.(තවද නිලධරයාගේ පාලන විෂය ඉක්මවා ගිය හේතුවක් මත සේවයේ නොසිටි කාලය ස්ථාන මාරු සේවා කාලය සඳහා ගණන් ගනු නොලැබේ.)

iii. කිසියම් දෙපාර්තමේන්තුවක් / අමාත්‍යාංශයක් යටතේ කුමන දිස්ත්‍රික්කයක සේවය කළ ද එම සේවා කාලය එම දෙපාර්තමේන්තුවේ/ අමාත්‍යාංශයේ සේවා කාලය වශයෙන් ගණන් ගනු ලැබේ. දිස්ත්‍රික්කයක් තුළ සේවා කාලය ගණන් ගැනීමේදී එම දිස්ත්‍රික්කය තුළ කුමන කාර්යාලයක සේවය කළ ද **දිස්ත්‍රික් සේවා කාලය** ලෙස ගණන් ගැනේ.

iv. අමාත්‍යාංශ / දෙපාර්තමේන්තු ස්ථාපිතවීම හෝ අහෝසිවීම හේතුවෙන් එක් අමාත්‍යාංශයක / දෙපාර්තමේන්තුවක සිට වෙනත් අමාත්‍යාංශයකට / දෙපාර්තමේන්තුවකට අනුයුක්ත කිරීමට සිදුවූ නිලධරයන් සම්බන්ධයෙන් සේවා කාලය ගණනය කිරීමේදී අහෝසි කරන ලද අමාත්‍යාංශයේ / දෙපාර්තමේන්තුවේ සේවා කාලය ද, විනය හේතු හෝ දඬුවම් මාරුවක් ලෙස ස්ථාන මාරු ලද නිලධාරීන් හැර දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අවශ්‍යතාව මත ස්ථාන මාරු ලද නිලධාරීන්ගේ සේවා කාලය ගණනය කිරීමේදී ඔවුන් අවසන් වරට සේවය කළ සේවා ස්ථානයේ සේවය කළ සේවා කාලයද අයදුම්පත් ඉදිරිපත් කිරීමට අවශ්‍ය අවම සේවා කාලය සඳහා ගණන් ගනු ලැබේ.

**2:4:2** <u>ප්‍රියමනාප සේවා ස්ථානවල සේවා කාලය ගණනය කිරීම -</u>

i. ප්‍රියමනාප සේවා ස්ථානයක වසර 05ක සේවා කාලයක් සම්පූර්ණ කරන ලද නිලධාරියෙකුට නැවත ප්‍රියමනාප සේවා ස්ථානයකට මාරුවීමට ඉල්ලුම් කළ හැක්කේ ප්‍රියමනාප සේවා ස්ථානයෙන් පිටතට ගොස් වසර 15ක් ගතවී ඇත්නම් පමණි.

ii. සේවාවන් එකකට වැඩි ගණනක සේවය කළ නිලධරයන්ගේ ප්‍රියමනාප සේවා කාලය ගණන් ගැනීමේදී පෙර සේවයක දී එම සේවයට ප්‍රිය මනාප වූ දෙපාර්තමේන්තුවක සේවය කර ඇත්නම් එම සේවා කාලයද ගණන් ගනු ලැබේ (උදා:-කණිෂ්ඨ සේවක උසස්වීම් ලද නිලධරයන්ගේ කණිෂ්ඨ සේවක සේවා කාලය)

iii. ප්‍රියමනාප යැයි සැළකෙන සේවා ස්ථානයක දැනට සේවය කරන නිලධාරිණියකගේ සේවා ස්ථානයක සේවා කාලය ගණනය කිරීමේදී එම කාලය තුළදී ලබා ගෙන ඇති ප්‍රසූත නිවාඩු (වැටුප් සහිත, අඩවැටුප් හා වැටුප් රහිත) කාලය ගණනය කරනු නොලැබේ.

iv. ප්‍රියමනාප සේවා ස්ථානවල සේවය කරන නිලධරයන් විසින් නැවත ප්‍රියමනාප ස්ථානයකට කරනු ලබන මාරු ඉල්ලීම් සලකා බලනු ලබන්නේ එම සේවා ස්ථානවලට ප්‍රියමනාප නොවන සේවා ස්ථානවල සේවය කළ නිලධරයන් විසින් කරනු ලබන ඉල්ලීම් සලකා බැලීමෙන් පසුවය.

**2:4:3** <u>වාර්ෂික මාරු කමිටු විසින් කටයුතු නොකළ යුතු අවස්ථා</u>

පහත නම් දැක්වෙන ආයතනවලට වාර්ෂික ස්ථාන මාරු කමිටු මගින් ස්ථාන මාරු වීම් නොකළ යුතුය.

- ජනාධිපති ලේකම් කාර්යාලය
- අග්‍රාමාත්‍ය කාර්යාලය
- ආණ්ඩු පක්ෂ ප්‍රධාන සංවිධායක කාර්යාලය
- සභානායක ලේකම් කාර්යාලය
- අමාත්‍ය මණ්ඩල කාර්යාලය
- විපක්ෂ නායක ලේකම් කාර්යාලය

- අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා කාර්යාලයේ, සේවා කාලය වසර 05 ට වැඩි නිලධරයන් ස්ථාන මාරු කිරීමේදී යම් නිලධරයෙකු තවදුරටත් රඳවාගැනීමට එහි අධ්‍යක්ෂ ජනරාල් විසින් කරනු ලබන නිර්දේශය සලකා බැලීමට වාර්ෂික ස්ථාන මාරු කමිටු කටයුතු කළ යුතුය.
- පහත දැක්වෙන දෙපාර්තමේන්තු සහ ආයතනවලට වාර්ෂික ස්ථාන මාරු කමිටු මගින් මාරු වීම් කළ හැකි නමුත් එම දෙපාර්තමේන්තු / ආයතනවලට යොමු කරනු ලබන නිලධරයන් පිළිබඳව අදාළ දෙපාර්තමේන්තුවේ / ආයතනයේ ප්‍රධානියාගේ එකඟතාවයට යටත්ව මාරු වීම් ක්‍රියාත්මක කළ යුතුය.
    i. රාජ්‍ය සේවා කොමිෂන් සභාව
    ii. පොලිස් කොමිෂන් සභාව
    iii. මැතිවරණ කොමිෂන් සභාව

## 3. වාර්ෂික ස්ථාන මාරු කමිටුවේ සංයුතිය පිළිබඳ විස්තර

අංක 1914/8 හා 2015.05.12 දිනැති ගැසට් පත්‍රයේ පළවූ රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති 200 සංශෝධනයට අනුව:

දෙපාර්තමේන්තුවක හෝ අමාත්‍යාංශයක හෝ පිහිටුවනු ලබන වාර්ෂික ස්ථාන මාරු කමිටුවක සංයුතිය පහත සඳහන් පරිදි වන්නේය.

i. ඒකාබද්ධ සේවා අංශයේ සේවාවට අදාළ විෂය භාර සහකාර අධ්‍යක්ෂවරයෙක්
ii. ඒකාබද්ධ සේවා අංශයේ එම සේවාවට අදාළ නොවන විෂය භාර සහකාර අධ්‍යක්ෂවරයෙක්
iii. වාර්ෂික ස්ථාන මාරු කමිටුවේ විෂය පථයට අයත් වන නිලධර කණ්ඩායම් වලට හා සේවාවට අයත් රජයේ නිලධරයන්ගේ අවම වශයෙන් 15%ක නියෝජනයක් සහිත සෑම වෘත්තීය සමිතියක් විසින්ම නම් කළ නියෝජිතයෙක් හෝ පූර්ණ කාලීනව වෘත්තීය සමිති කටයුතු සඳහා මුදාහැර ඇති නිලධාරියෙක්

## 4. වාර්ෂික ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටුවේ සංයුතිය පිළිබඳ විස්තර

වාර්ෂික ස්ථාන මාරු යෝජනා සමාලෝචනය කිරීම සඳහා එක් එක් සේවාවන් සඳහා වෙන වෙනම වාර්ෂික ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටු පිහිටු වීමට ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් කටයුතු කරනු ලැබේ. එම එක් එක් සමාලෝචන කමිටු වල සංයුතිය පහත පරිදි වේ.

i. ඒකාබද්ධ සේවා අංශයේ සේවාවට අදාළ විෂය භාර අධ්‍යක්ෂවරයෙක්
ii. ඒකාබද්ධ සේවා අංශයේ සේවාවට අදාළ විෂය භාර සහකාර අධ්‍යක්ෂවරයෙක්
iii. ඒකාබද්ධ සේවා අංශයේ සේවාවට අදාළ නොවන විෂය භාර සහකාර අධ්‍යක්ෂවරයෙක්
iv. එක් එක් සේවාවට අයත් රජයේ නිලධරයන්ගේ අවම වශයෙන් 15%ක නියෝජනයක් සහිත සෑම වෘත්තීය සමිතියක් විසින්ම නම් කළ නියෝජිතයෙක් හෝ පූර්ණකාලීනව වෘත්තීය සමිති කටයුතු සඳහා මුදාහැර ඇති නිලධාරියෙක්.

## 5. වාර්ෂික ස්ථාන මාරු ලබා දීමේදී සැලකිල්ලට ගන්නා වෙනත් පොදු කරුණු

5:1 විශේෂිත කරුණු

i. යම් නිලධරයකුගේ කලත්‍රයා පොලිසියේ හෝ ත්‍රිවිධ හමුදාවේ උතුරු නැගෙනහිර ක්‍රියාන්විත රාජකාරියේදී ආබාධිත තත්වයට පත්ව ඇති බවට ලිඛිත සාක්ෂි ඉදිරිපත් කරන විට නිලධරයන්ගේ ස්ථාන මාරුවීම් කළයුතු වන්නේ ඔවුන්ගේ ඉල්ලීම් අනුව පමණි. එසේම එවැනි නිලධරයන්ගේ ස්ථාන මාරුවීම් ඉල්ලීම් පිළිබඳව ප්‍රමුඛත්වය දැක්විය යුතු වේ. මෙවැනි නිලධරයන් ප්‍රියමනාප සේවා ස්ථානයකින් පිටතට මාරු කිරීමට සිදුවන්නේ නම් ඊට ආසන්නම කාර්යාලයකට හෝ නිලධරයාගේ ඉල්ලීමකට අදාළ කාර්යාලයට මාරු කළ යුතුය.
ii. සෑම විටම නිලධරයාගේ ඉල්ලීම අනුව තම කලත්‍රයාගේ සේවා ස්ථානය අයත් ප්‍රදේශයට ආසන්න සේවා ස්ථානයකට මාරුවීම් ලබා දීමට හැකි සෑම උත්සාහයක්ම දැරිය යුතු අතර ප්‍රියමනාප නොවන්නා වූ කාර්ය ස්ථානයන්හි සේවය සඳහා නිලධරයන් තෝරා ගැනීමේදී පාසල් යන දරුවන් ඇති විවාහක නිලධරයන්ට වඩා අවිවාහක නිලධරයන් ද, පාසල් යන දරුවන් නොමැති විවාහක නිලධරයන් ද හැකි සෑම අවස්ථාවකදීම තෝරා ගැනීමට ප්‍රමුඛතාවය ලබා දේ.
iii. පාසල් යන දරුවන්, ආබාධිත දරුවන්, දීර්ඝ කාලීන අසනීප මත එක්තැන්ව සිටින කලත්‍රයන් සහ කලත්‍රයා විදේශගතව සිටින අවස්ථාවන්හි වැනි පිළිගත හැකි කරුණු ඇතිව තම දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශයන් සහිතව ඉදිරිපත් කරන ඉල්ලීම් පිළිබඳ සැලකිල්ලට ගෙන මාරුවීම් සම්බන්ධව සළකා බලනු ලැබේ.
iv. ආබාධිත පුනරුත්ථාපන කොන්දේසි යටතේ බඳවාගත් නිලධාරීන් ඔවුන්ගේ ඉල්ලීමක් නොමැති කල්හි ස්ථාන මාරුවීම් කරනු නොලැබේ.

**5:2 වාර්ෂික ස්ථාන මාරුවීම්වලට යටත් නොවන නිලධාරීන්**

i. අවුරුදු 53 ඉක්මවූ නිලධරයන් දිස්ත්‍රික්කය තුළ වෙනත් සේවා ස්ථානයකට මාරු කළ හැකි වුව ද ඔවුන්ගේ ඉල්ලීමක් නොමැතිව දිස්ත්‍රික්කයෙන් පිටතට මාරු නොකළ යුතුය.

ii. වාර්ෂික ස්ථාන මාරු සඳහා කාල ගණනය කරනු ලබන දෙසැම්බර් 31 දිනට (උදා: 2017 වර්ෂය සඳහා 2016.12.31 දිනට) අවු: 58 ඉක්මවූ නිලධරයන් ඔවුන්ගේ ඉල්ලීමක් නොවන කල්හි දිස්ත්‍රික්කය තුළ වුව ද මාරු නොකළ යුතුය .ප්‍රියමනාප සේවා ස්ථානයන්හි සේවය කරන දෙසැම්බර් 31 වන දිනට වයස අවුරුදු 59 ඉක්මවූ නිලධරයන්ද ඔවුන්ගේ ඉල්ලීමක් නොමැති කල්හි ස්ථාන මාරු නොකළ යුතුය.

**5:3 වෘත්තීය සංගම් සඳහා අනුග්‍රහය**

i. කම්කරු කොමසාරිස් ජනරාල් විසින් ලියාපදිංචි කරනු ලැබූ ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් පිළිගත් ඒකාබද්ධ සේවයේ සේවයකට අයත් වෘත්තීය සංගමයක, සංවිධානයක ලේකම්, සභාපති, භාණ්ඩාගාරික හා මධ්‍ය විධායක සභිකයන් මාරු කරන්නේ නම් අදාළ වෘත්තීය සංගමයේ ලේකම්ගේ නිර්දේශ සැලකිල්ලට ගෙන සංගමයේ කටයුතුවලට බාධා නොවන සේවා ස්ථානයකට මාරු කළ යුතු ය.

ii. මෙම වගන්තියේ දැක්වෙන අනුග්‍රහ භුක්ති විඳීමට අපේක්ෂා කරන ඒකාබද්ධ සේවයේ වෘත්තීය සංගම්වල නිලධරයන් සංගමයේ ලේකම් මගින් ඒ සඳහා අයදුම්පත්‍රයක් පිළියෙල කර ( ආයතන සංග්‍රහයේ XXVපරිච්ඡේදයෙහි 7:5 උපවගන්තිය අනුව) ස්ථාන මාරු කමිටු රැස්වීමට සති දෙකකටවත් පෙර ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ආයතන සංග්‍රහයේ XXV පරිච්ඡේදයේ 7:2 උප වගන්තිය අනුව අනුග්‍රහය ලබා දිය යුතු වන්නේ, කවර නිලතල වලටද යන වගත්, කුමන සංගමයනට ද යන වගත්, අනුයුක්ත කලයුතු වන්නේ කවර ස්ථාන වලටද යන වගත්, රාජ්‍ය පරිපාලන ලේකම් විසින් තීරණය කරනු ලැබේ. මේ පිළිබඳව පසුව ඉදිරිපත් කරන ඉල්ලීම් සලකා බලනු නොලැබේ. ප්‍රියමනාප දෙපාර්තමේන්තුවල රැඳී සිටීමට මෙම අනුග්‍රහය අදාළ කර ගත නොහැක.

06. ඒකාබද්ධ සේවා අංශයේ මාරු කාල සටහන:-

| | |
|---|---|
| ජූනි 01ට පෙර | ස්ථාන මාරු කමිටු පිහිටුවීම |
| ජූනි 30ට පෙර | වාර්ෂික ස්ථාන මාරු චක්‍රලේඛය නිකුත් කිරීම. |
| ජූලි 31ට පෙර | (1) ඒ.සේ./වා.ස්.මා./01 ආකෘතියට අනුව සම්පූර්ණ කරන ලද අයදුම්පත්<br>(2)ඒ.සේ./වා.ස්.මා./02 ආකෘතිය අනුව උපලේඛනගත කළ අයදුම්පත් ලේඛණය<br>(3) ඒ.සේ./වා.ස්.මා./03 ආකෘතිය (වර්තමාන සේවා ස්ථානයේ වසර 5ට වැඩි නිලධාරීන්ගේ නාමලේඛනය) සම්පූර්ණ කර ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත එවීම |
| අගෝස්තු 31ට පෙර | ස්ථාන මාරු කමිටුව විසින් ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත ස්ථාන මාරු යෝජනා ඉදිරිපත් කිරීම. |
| සැප්තැම්බර් 15ට පෙර | ස්ථාන මාරු තීරණ අමාත්‍යාංශ/දෙපාර්තමේන්තුවලට දැන්වීම සහ වාර්ෂික ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටු පත් කිරීම. |
| සැප්තැම්බර් 29ට පෙර | ස්ථාන මාරුවීම් වලට විරුද්ධව අතෘප්තිමත් නිළධරයන් විසින් ආයතන ප්‍රධානීන් මගින් කරුණු දැක්වීමට ලබා දී ඇති අවසන් දිනය. |
| ඔක්තෝබර් 15ට පෙර | වාර්ෂික ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටු විසින් ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත නිර්දේශ ලබා දිය යුතු අවසාන දිනය. |
| නොවැම්බර් 01ට පෙර | වාර්ෂික ස්ථාන මාරු නියෝග නිකුත් කළ යුතු දිනය. |
| ජනවාරි 01 | වාර්ෂික ස්ථාන මාරු නියෝග ක්‍රියාත්මක විය යුතු දිනය. |

**7. වාර්ෂික ස්ථාන මාරු නියෝගවලට විරුද්ධව අභියාචනා ඉදිරිපත් කිරීම.**

7.1 ස්ථාන මාරු කිරීමක් පිළිබඳව දෙන ලද නියෝගයකට එරෙහිව කිසියම් රජයේ නිලධරයෙකු විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනයක් ඉදිරිපත් කරන්නේ නම්, එම අභියාචනය රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීති සංග්‍රහයෙහි අංක 23 පරිශිෂ්ඨයට ප්‍රකාරව පමණක් ඉදිරිපත් කළ යුතු වන්නේය. තවද තමන් විසින් ඉදිරිපත් කරනු ලබන කරුණු තහවුරු කිරීමට අදාල ලියවිලි වල සහතික කළ පිටපත් එම අභියාචනය සමග ඉදිරිපත් කිරීමටද, ඔහු ක්‍රියා කළ යුතු වන්නේය.

7.2 රජයේ නිලධරයෙකු විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනයක් ඉදිරිපත් කළ යුතු වන්නේ, ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් මගින් වන අතර, එම අභියාචනයේ පිටපතක් අදාළ පරිදි දෙපාර්තමේන්තු ප්‍රධාන හා ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත ද යොමු කළ යුතු වන්නේය.තමන් වෙත ඉදිරිපත් වන අභියාචනය අප්‍රමාදවම තම නිරීක්ෂණ සහිතව රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු කිරීම ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ වගකීම වන්නේය.නිලධරයාට තම කැමැත්ත පරිදි, අභියාචනයේ ප්‍රගමන පිටපතක් ඍජුවම රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ හැක්කේය.

7.3 ස්ථාන මාරු කිරීමේ නියෝගයකට එරෙහිව ඉදිරිපත් කරනු ලබන අභියාචනයක්, එම ස්ථාන මාරු කිරීමේ නියෝගය අදාළ රජයේ නිලධාරියා වෙත ලද දින සිට දින 14 ක් ඇතුළත ඉදිරිපත් කළ යුතු වන්නේය. නියමිත කාලය තුළදී ඉදිරිපත් නොවන අභියාචනා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ප්‍රතික්ෂේප කරනු ලබන්නේය.

7.4 කොමිෂන් සභාව වෙත යොමු කිරීම සඳහා නිලධරයෙකු විසින් භාර දෙනු ලබන අභියාචනය අදාල සියලු ලිපිගොණු, ලිපි ලේඛන හා වාර්තා ආදියද, ඊට අදාළ තම නිරීක්ෂණ ද, නිර්දේශද සහිතව එම අභියාචනය ලැබී දින 15 ක් ඇතුළත රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ඉදිරිපත් කිරීමට අදාල දෙපාර්තමේන්තු ප්‍රධාන හා ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වග බලා ගත යුතු වන්නේය. එසේවුව ද වුවත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති සංග්‍රහයෙහි XVIII වැනි පරිච්ඡේදයේ සඳහන් වාර්ෂික ස්ථාන මාරු සම්බන්ධ අභියාචනා අදාළ ලිපිගොනු, ලිපි ලේඛන, වාර්තා, නිරීක්ෂණ හා නිර්දේශ සමග එම වර්ෂයේ නොවැම්බර් මස 15 වැනි දිනට ප්‍රථම රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතු වන්නේය.

7.5 මෙම පරිච්ඡේදයෙහි සඳහන් නියමයන්ට අනුගතව තම අභියාචන ඉදිරිපත් කිරීම සෑම රජයේ නිලධරයෙකුගේම වගකීම වන අතර, ඊට පටහැනිව ඉදිරිපත් කරනු ලබන අභියාචනා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සළකා බලනු නොබලන්නේය.

7.6 ඉහත 7.4 වගන්තියේ සඳහන් ලියවිලි ලැබී දින 15 ක් ඇතුළත, ස්ථාන මාරු කිරීමේ නියෝගයකට එරෙහිව රජයේ නිලධරයෙකු විසින් ඉදිරිපත් කර ඇති අභියාචනා සම්බන්ධයෙන් තීරණයක් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ගනු ඇත්තේය.

7.7 ඉහත සඳහන් පරිදි ඉදිරිපත් කර ඇති අභියාචනයක් සම්බන්ධයෙන් වන රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය ඍජුවම අභියාචක වෙත දන්වනු ලබන අතර, අදාළ ලිපිගොනු යථාවත් කර ගැනීම සඳහා එහි පිටපත් ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් හා දෙපාර්තමේන්තු ප්‍රධාන වෙත යවනු ලබන්නේය.

7.8 රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගයකින් හෝ තීරණයකින් හෝ අතෘප්තියට පත්වන රජයේ නිලධරයෙකුට 2002 අංක 04 දරණ පරිපාලන අභියාචනා විනිශ්චය අධිකාරිය පනතේ සඳහන් විධිවිධාන වලට අනුකූලව පරිපාලන අභියාචනා විනිශ්චය අධිකාරිය වෙත අභියාචනයක් ඉදිරිපත් කිරීමට හිමිකම ඇත්තේය. එසේ වුව ද ඒ සඳහා පරිපාලන අභියාචනා විනිශ්චය අධිකාරියේ අවසන් තීරණයක් ලැබෙන තෙක් අදාළ ස්ථාන මාරු නියෝගය එලෙසම ක්‍රියාත්මක විය යුතු වන්නේය.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය පරිදි,



……………………………

ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්

රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය

දිනය : 2016.06.29

නිල මුද්‍රාව : කේ. වී. පී. එම්. ජේ. ගමගේ
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්
රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

# ඒකාබද්ධ සේවයේ වාර්ෂික ස්ථානමාරු සඳහා අයදුම්පත

**ඒ.සේ. /වා.ස්.මා. /01**

| | | | |
|---|---|---|---|
| **තනතුර හා පන්තිය** | | **ඉ-මානව සම්පත් අංකය** (කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි) | |

**අ.** පෞද්ගලික තොරතුරු

| | | | |
|---|---|---|---|
| **01.** සම්පූර්ණ නම:- | | | |
| **02.** මුලකුරු සමග නම:- | | | |
| **03.** මුලකුරු සමග නම:- (ඉංග්‍රීසියෙන්) | | | |
| **04.** උපන් දිනය:- YYYY/MM/DD | **05.** වයස:- (2016.12.31 දිනට) අවු.............මාස..............දින.............. | **06.** ජාතික හැඳුනුම්පත් අංකය:- | **07.** ස්ත්‍රී/පුරුෂ භාවය:- |
| **08.** ස්ථිර ලිපිනය:- | **09.** තාවකාලික ලිපිනය:- | **10.** දුරකථන අංකය<br>කාර්යාලය:-<br>පෞද්ගලික:- | |
| **11.** විවාහක අවිවාහක බව:- | **12.** කලත්‍රයාගේ නම:- | **13.** කලත්‍රයාගේ රැකියාව හා සේවා ස්ථානය:- | |
| **14.** දරුවන් ගණන | **15.** ඔවුන්ගේ වයස:- | **16.** ඉගෙනුම ලබන පාසැල :- | |

**ආ.** සේවා තොරතුරු

| | |
|---|---|
| **17.** පත්වීම් ලිපියේ අංකය:- | **18.** ස්ථිර කර තිබේද? |
| **19.** වර්තමාන සේවා ස්ථානය:- | **20.** සේවා ස්ථානය පිහිටි නගරය:- |
| **21.** වර්තමාන සේවා ස්ථානයට වාර්තාකල දිනය :- YYYY/MM/DD | **22.** වර්තමාන සේවා ස්ථානයේ සේවා කාලය :- (2016.12.31 දිනට) අවු…………මාස…………දින……… |
| **23.** ප්‍රතිලාභ ලබන සේවා ස්ථානයක සේවය කර තිබේ ද? (ප්‍රියමනාප) | |

| | | | සේවා කාලය | |
|---|---|---|---|---|
| **24.** රජයේ සේවයේ පූර්ව සේවා ස්ථාන | සේවා ස්ථානය | | සිට | දක්වා |
| | 1 | | | |
| | 2 | | | |
| | 3 | | | |
| | 4 | | | |

ඇ. <u>ස්ථාන මාරු ඉල්ලීම පිළිබඳ තොරතුරු</u>

- දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත කෙරෙන ඉල්ලීම් පැහැදිලිව සඳහන් කරන්න.

| 25 | සේවා ස්ථානය | සේවා ස්ථානය පිහිටි නගරය |
|---|---|---|
| 1 | | |
| 2 | | |
| 3 | | |

**26.** ඉහත සඳහන් කර ඇති සේවා ස්ථාන වලට අමතරව ඊට ආසන්න සේවා ස්ථානයකට ස්ථාන මාරුවීමක් ලබා දෙන්නේ නම් ඊට එකඟද? ඔව්/නැත

**27.** ස්ථාන මාරු ඉල්ලුම් කිරීමට හේතු :- (නිලධාරියා හෝ යැපෙන්නන් යම් ආබාධිත තත්වයින් පෙළෙන්නේ නම් ඒ බවට වෛද්‍ය සහතික වලින් තහවුරු කිරීමට යටත්ව මෙහි සඳහන් කරන්න)

**28.** යම් හෙයකින් ඔබට වාර්ෂික ස්ථාන මාරුවක් නොලදහොත් ඉහත තොරතුරු, **2017.06.30** දින තෙක් සාමාන්‍ය ස්ථාන මාරු ලබා දීම සළකා බැලීමට භාවිත කිරීමට එකඟ වන්නේද? ඔව්/නැත

ඉහත දක්වා ඇති තොරතුරු සියල්ල සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි.

................................ ................................

දිනය අත්සන

---

ඈ. <u>අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය:-</u>

➢ ඉහත නම සඳහන් නිලධාරියාගේ ස්ථාන මාරු ඉල්ලීම අනුප්‍රාප්තිකයෙකු සහිතව/ රහිතව/ පසුව ලබාදීමේ පදනම මත නිර්දේශ කරමි.

................................ ................................

දිනය අත්සන

නිල මුද්‍රාව

එක් එක් සේවාවන් හා පන්ති සඳහා වෙන වෙනම මෙම ආකෘති සම්පූර්ණ කිරීමට කටයුතු කරන්න.

## වාර්ෂික ස්ථාන මාරුවීම් අයදුම්පත් උපලේඛනය - 2017 වර්ෂය

අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව :-.................................................................................................................. .....

ප්‍රාදේශීය කාර්යාලය :-.........................................................................................................................

| අනු අංකය | නිලධරයාගේ නම | ස්ථිර පත්වීම් ලිපියේ අංකය | ජාතික හැඳුනුම්පත් අංකය | තනතුර/ ශ්‍රේණිය හා මාධ්‍යය | උපන් දිනය හා 2016.12.31 දිනට වයස හා ලිපිනය | විවාහක අවිවාහක බව - කලත්‍රයාගේ සේවා ස්ථානය | දරුවන් සංඛ්‍යාව හා පාසැල් යන දරුවන් සංඛ්‍යාව | කලත්‍රයා ආරක්ෂක සේවයේ ක්‍රියාන්විත රාජකාරියේ සිට ආබාධිත වූ අයෙක්ද? | සේවා ස්ථාන හා කාල සීමාව | මාරුවීම ඉල්ලීමට හේතු | මාරුවීමට කැමති ස්ථානය | මාරු කමිටුවේ තීරණය |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | |

සියළුම නිලධාරීන්ගේ අයදුම්පත් මෙම ලේඛනයට ඇතුලත් කර ඇති බව සහතික කරමි.

සකස් කළේ : නම :- අත්සන :-

පරීක්ෂා කළේ: නම :- අත්සන :-

දිනය :-

..................................................................

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන හා නිල මුද්‍රාව

එක් එක් සේවාවන් සඳහා වෙන වෙනම මෙම ආකෘති සම්පූර්ණ කිරීමට කටයුතු කරන්න.

**ඒ.සේ. /වා.ස්.මා. /03**

**එක් දිස්ත්‍රික්කයක, එක් සේවා ස්ථානයක අවුරුදු 05කට වැඩි කාලයක් සේවය කර ඇති සියලුම නිලධාරීන්ගේ විස්තර මෙහි අනිවාර්යයෙන්ම ඇතුළත් විය යුතු බව සලකන්න. (2016.12.31 දිනට)**
**වැඩිම සේවා කාලයක් ඇති නිලධාරීන්ගේ නම් මුලින්ම ඇතුළත් විය යුතු බව සලකන්න.**

අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව :-..........................................................................................................
ප්‍රාදේශීය කාර්යාලය :-.........................................................................................................

| නිලධරයාගේ නම: මයා/ මිය/ මෙය යන්න සඳහන් කරන්න | ස්ථිර පත්වීම් ලිපියේ අංකය | ජාතික හැඳුනුම් පත් අංකය | තනතුර/ ශ්‍රේණිය හා මාධ්‍යය | උපන් දිනය හා 2016.12.31 දිනට වයස හා ලිපිනය | වර්තමාන සේවා ස්ථානයේ සේවා කාලය 2016.12.31 දිනට | දෙපාර්තමේන්තුව තුල සම්පූර්ණ සේවා කාලය | විවාහක අවිවාහක බව - කලත්‍රයාගේ සේවා ස්ථානය | පාසැල් යන ළමයින් පිළිබඳ විස්තර | දැනට පදිංචි ප්‍රදේශය හා ලිපිනය (ස්ථිර හා තාවකාලික ලිපිනය) | දැනට පදිංචි ස්ථානයේ සිට වර්තමාන සේවා ස්ථානයට ඇති දුර | මුල් පත්වීමේ සිට සේවා ස්ථාන හා කාලසීමාවන් | වාර්ෂික ස්ථාන මාරු සඳහා අයදුම්කර තිබේද? අයදුම් කර නොමැති නම් ස්ථාන මාරුවක් ලැබුනහොත් සේවය කිරීමට කැමැති ස්ථාන 03 ක් |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | |

* අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු/ කාර්යාලයන්හි රඳවා ගැනීමට අවශ්‍ය සහ වෛද්‍ය සහතික මගින් සනාථ කර ඇති බරපතල රෝගාබාධ වලින් පෙළෙන ස්ථාන මාරු නොකළයුතු නිලධාරීන් සම්බන්ධයෙන් දෙපාර්තමේන්තු ප්‍රධානියා පුද්ගලිකවම සනාථ කළ යුතුය.

සකස් කළේ• :- නම අත්සන:-

(අ) මෙම අමාත්‍යාංශයේ /දෙපාර්තමේන්තුවේ /කාර්යාලයේ අවුරුදු 05 ට වැඩි සේවා කාලයක් ඇති සියලුම නිලධාරීන් පිළිබඳ විස්තර මෙම ලේඛනයට ඇතුළත් කර ඇති බව

සියලුම තොරතුරු නිවැරදි බවට සෑහීමට පත්වීමෙන් අනතුරුව සහතික කරමි.සාවද්‍ය තොරතුරු සැපයීම් සම්බන්ධයෙන් අදාල විනය නිලධාරියාට වාර්තා කිරීමට සිදුවිය හැකි බව සැළකිල්ලට ගනිමින් සහතික කරමි.

පරීක්ෂා කළේ :- නම:……………………………………………..

……………………………………… අත්සන

දිනය:-

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන (නිල මුද්‍රාව)

සෑම නිලධරයෙක් පිළිබඳවම නිවැරදි හා සම්පූර්ණ තොරතුරු සැපයීමට ආයතන/ දෙපාර්තමේන්තු ප්‍රධානීන් වගබලා ගත යුතුය. සාවද්‍ය තොරතුරු ඇති බව හෙළිවුවහොත් ඒ පිළිබඳව අදාළ ආයතන/ දෙපාර්තමේන්තු ප්රධානීන් හා එම ලැයිස්තු සකස් කළ හා හරි වැරදි බලන ලද නිලධාරීන් වගකීමට බැඳී සිටින අතර ඔවුන් විනයානුකූල කටයුතුවලට ද යටත් වේ.